**පාඩම 19**

**ක්‍රියාකාරකම 1**

**පහත සඳහන් ඡේදය අවධානයෙන් යුතු ව කියවන්න.**

**කැලයේ අප සිත් ගත් එක තැනක් වූයේ දිය ඇල්ල යි. කන්ද මැද්දේ රත්තණ පඳුරක් අස්සෙන් මතුවන පුංචි දිය කඳුරක් වේගයෙන් පහළට ගලා බසී. වතුර ගලන්නේත් පහත් තැනකට යැ යි පෙන්වන ලෙසින් තවත් දිය කඳුරු කීපයක් ඊට ම එක් වෙයි.එහෙයින් ටික දුරක් යන්නට පෙර සැහෙන දිය කඳක් ගලා බසියි. මේ දිය කඳ එක් තැනක දී ගල් තලාවකින් පහළට ඇද හැලී අපූරු දිය ඇල්ලක් මවයි. ලොකු කුඩා ගල් පර්වත රැසක හැපෙන දිය කඳ සුදු පැහැයෙන් රුරා ගොස් ඇළක් බවට පත් වී කැලෑවේ නොපෙනී යයි. මේ ඇළ නැවත මතුවන්නේ ගම මැදින් ගලා බසිමිනි.**

**දිය ඇල්ලේ සෝෂාව කැලෑවේ ටික දුරක් පැතිරේ ගල් තලා දෙපස ඕකිඩ්, වෙසක් ආදී මල් ද කුඩා හැඩයා, ලොකු හැඩයා ආදී පැළෑටි ද වැවී ඇත.කිසිවකු අතින් සාත්තු නො ලබන මල් පඳුරු විස්තර කළ නො හැකි අලංකාර මල් හට ගන්වයි.**

**ගඟ අද්දර කැලේ,**

**සෝමවීර සේනානායක**

**ක්‍රියාකාරකම 2**

ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති <u>**තිත් ඉරි මත**</u> ලියන්න.

1. රත්තණ පඳුරක් අස්සෙන් මතු වන්නේ කුමක් ද?. .......................................
2. දිය කඳ ගල් තලාවකින් පහළට ඇද හැලෙන විට මැවෙන්නේ කුමක් ද?............

**ඡේදය කියවා පහත සඳහන් <u>ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද වැරදි නම් X ලකුණ ද</u> වරහන් තුළ යොදන්න.**

1. **කැලයේ අප සිත් ගත් තැනක් වූයේ දියකඳුර යි. ( )**
2. **ගල් තලා දෙපස ඕකිඩ්,වෙසක් ආදී මල් වර්ග වැවී ඇත. ( )**

දී ඇති වචනයට ගැළපෙන අදහස ඊතලයකින් යා කරන්න.

| | |
|---|---|
| සෝෂාව | ලස්සන |
| පැළැටි | වතුර උල්පතක් |
| අලංකාර | අධික ශබ්දය |
| දිය කඳුරක් | කුඩා ශාක |

නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

1. රත්තණ පඳුර අස්සෙන් මතුවූයේ .....................................( දිය ඇල්ලකි/ දිය කඳුරකි).
2. දිය කඳ ............................(ඇළක්/ ගඟක්) බවට පත් වී නොපෙනී යයි.

පාඩම 20

ප්‍රවෘත්ති

ක්‍රියාකාරකම 1

1. දිනපතා ම ප්‍රවෘත්ති අසන්න.
2. එක් ප්‍රවෘත්තියක් ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

3. පාසලට වැදගත් වන ප්‍රවෘත්ති එකතුවකින් පාසලේ උදෑසන රැස්වීමේ දී ඉදිරිපත් කිරීමට ප්‍රවෘත්ති ප්‍රකාශයක් සකස් කරන්න.

..........................................................................................................................

..........................................................................................................